# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල


තැ.පෙ.අංකය
த. பெ.இ
2171635
Po.Box No
10120

ෆැක්ස්
தொலைநகல
Fax
011-

දුරකථන
தொலைபேசி
Telephone
011-2887973
(HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site
www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail
dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO
1611 / 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No
/ 2024

දිනය
திக
Date
22/10 /2024
පැය 0940

## මාධ්‍ය නිවේදනය

**01. අයිස් මත්ද්‍රව්‍ය හා හෙරොයින් සමඟ සැකකාරියක් අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ පුත්තලම ඒකකය.**

2024.10.21 වන දින රාත්‍රී කාලයේ පුත්තලම පොලිස් වසමේ කූබා නගර් ප්‍රදේශයේදී පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ පුත්තලම ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 02 මිලිග්‍රෑම් 600 ක් හා අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 400 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක් අත්අඩංගුවට ගෙන පුත්තලම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 52 ක් වන කූබා නගර්, පුත්තලම ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

සැකකාරිය හට පුත්තලම මහේස්ත්‍රාත් අධිකරණයේ පවතින නඩුවකට විවෘත වරෙන්තු නිකුත් වී ඇති බවටද විමර්ශනයේදී අනාවරණය වී ඇත. පුත්තලම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය හා ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - එඬේරමුල්ල පොලිස් ස්ථානය**

2024.10.21 වන දින උදෑසන කාලයේ එඬේරමුල්ල පොලිස් වසමේ ශාන්ත මරියා මාවතේදී එඬේරමුල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 80 ක් හා ගංජා ග්‍රෑම් 08 මිලිග්‍රෑම් 460 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 22 ක් වන හුණුපිටිය, වත්තල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

එඬේරමුල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**